# මාධ්‍ය නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව, 30, ජනාධිපති මාවත, කොළඹ 01, ශ්‍රී ලංකාව

+94 11 2477424 / +94 11 2477423 +94 11 2346257

communications@cbsl.lk / dcommunications@cbsl.lk www.cbsl.gov.lk

ශ්‍රී ලංකා මහ බැංකුව

இலங்கை மத்திய வங்கி

CENTRAL BANK OF SRI LANKA


| | |
|---|---|
| නිකුත් කළේ | ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව |
| දිනය | 2021.01.21 |

## අන්තර්ජාලය පදනම් කරගත් මූල්‍ය වංචා වලින් ප්‍රවේශම් වන්න

ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සමාජ ජාල, අන්තර්ජාලය පදනම් කර ගත් සහ ජංගම දුරකතන යෙදුම් හරහා විවිධ වර්ගයේ මූල්‍ය වංචා සිදු කෙරෙන බව තොරතුරු ලැබී ඇත.

මෙම වංචා බොහෝමයක් මහජනතාව ආකර්ෂණය කරගන්නා අන්තර්ජාලය හෝ ජංගම දුරකතන පදනම් කර ගත් පහසු ණය යෝජනා ක්‍රම හරහා සිදු කෙරේ. එවැනි ණය අයදුම්පත් ඇගයීමේ ක්‍රියාවලියේදී, වංචාකරුවන් සාමාන්‍ය ජනතාවගේ පහත සඳහන් **රහස්‍ය පාරිභෝගික තොරතුරු ඔවුන්ගෙන් ලබා ගැනීමට** මහජනතාව පොළඹවයි.

- හර / ණය කාඩ්පත් - **කාඩ්පත් අංකය**, පුද්ගලික හැඳුනුම් අංක (**PIN**), කාඩ්පත්වල පිටුපස සඳහන් වන කාඩ්පත් සහතික කිරීමට යොදා ගන්නා **CVV, CVC** හෝ **CVS** යන්නෙන් හැඳින්වෙන ගෙවීම් කාඩ්පත් සත්‍යාපන අංක, කාඩ්පත් කල් ඉකුත් වන දිනය, ගනුදෙනු සහතික කිරීමේදී යොදාගන්නා එක්වරක් පමණක් භාවිතා කල හැකි මුරපද (One Time Password – **OTP**)
- අන්තර්ජාල බැංකුකරණය - **පරිශීලක නාමය**, **රහස් පදය**, **OTP**
- ජංගම බැංකුකරණය (ගෙවීම් යෙදුම්) - **පරිශීලක නාමය**, **රහස් පදය**, **OTP**

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනතාවට පහත සඳහන් උපදෙස් පිළිපදින ලෙස දැනුම් දෙනු ලැබේ.

- මුදල් ණයට දීමේ ව්‍යාපාර පවත්වා ගෙන යෑමේ මුවාවෙන් සිදු කෙරෙන වංචාවන්ට ගොදුරු නො වී සිටීමට නිසි උත්සාහයක් හා සැලකිල්ලක් දැක්වීම.
- මූල්‍ය ගනුදෙනුව සඳහා ගිවිසුමකට එළඹීමට පෙර මහජනතාව මූල්‍ය ගනුදෙනුව සහ ණය දෙන පාර්ශවයේ සම්පූර්ණ තොරතුරු ලබා ගැනීම.
- සෑම විටම මුදල් ගනුදෙනුවකට එළඹීමේ දී යම් නියාමන අධිකාරියක් මගින් නියාමනයකට ලක්කෙරෙන ආයතන කෙරෙහි විශ්වාසය තැබීම.
- පහසු / ක්ෂණික ණය යෝජනා ක්‍රම සමග කටයුතු කිරීමේදී අතිශයින්ම සුපරීක්ෂාකාරී වීම.
- ගිවිසුම්වල නියමයන් සහ කොන්දේසි වල අන්තර්ගතයන් සම්පූර්ණයෙන් වටහා ගැනීම අපහසු නම් එවැනි ගිවිසුම්වලට එළඹීමෙන් වැලකීම.
- පහත දැක්වෙන ලක්ෂණ සහිත පහසු / ක්ෂණික ණය යෝජනා ක්‍රම සඳහා අයදුම් කිරීමේදී ප්‍රවේශම් වන ලෙස ඉල්ලා සිටී;
  - පළමු ණය සඳහා ශුන්‍ය පොලිය වැනි ගනුදෙනුකරුවන් ආකර්ෂණය කරන ආකර්ශනීය පාඨ
  - ආරම්භක පොලී අනුපාත අඩු වුවද පසුවට ඉතා ඉහළ පොලී අනුපාත අය කිරීම
  - අඩු ලියකියවිලි අවශ්‍ය යැයි කරන වාරයන්
  - මුදල් ණය දෙන්නන් පිළිබඳ ප්‍රමාණවත් තොරතුරු සොයාගත නොහැකි වීම
  - ණය දීර්ඝ කිරීම් ඉල්ලා සිටිය හැකි අතර තත්වයන් නොතකා ඕනෑම අවස්ථාවක ලබා දීම
  - ඉක්මනින් අනුමැතිය ලබා දෙන බවට කරනු ලබන ප්‍රචාරයන්
  - දුරකථනයේ ඇති සම්බන්ධතා ලැයිස්තුව, ඡායාරූප, ලිපිගොනු සහ ලේඛන වෙත ප්‍රවේශ වීමට අවසර ඉල්ලා සිටීම

මෙවැනි මූල්‍ය වංචා වලින් සුපරීක්ෂාකාරී වන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මහජනතාවගෙන් ඉල්ලා සිටින අතර, තමන්ගේ රහස්‍ය තොරතුරු විශේෂයෙන්ම **ගිණුම් පරිශීලක නාම**, **මුරපද**, **පුද්ගලික හැඳුනුම් අංක** (**PINs**),

එක්වරක් පමණක් භාවිතාවන මුරපද (OTP), හෝ ගිණුම්වලට පිවිසීමේදී ගිණුම් හිමියාගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා භාවිතා කළ හැකි වෙනත් ඕනෑම රහස්‍ය තොරතුරක් අනෙකුත් පුද්ගලයින් සමග හුවමාරු කර නොගැනීමට පියවර ගත යුතු බවත්, දුරකථන භාවිතා කරන්නන් විසින් ණය දෙන ආයතන වලට දුරකථනයේ ගබඩා කර ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීමට අවසර ලබා නොදෙන ලෙසත් මහ බැංකුව අවධාරණය කරයි.

තවද, තම බැංකු හෝ බැංකු නොවන මූල්‍ය ආයතන වලින් කෙටි පණිවිඩ වැනි එසැනින් ගනුදෙනු සම්බන්ධ තොරතුරු දැනුම්දීමේ සේවා සක්‍රීය කරගන්නා ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව ජනතාවට දැනුම් දෙනු ලබන අතර මෙම කෙටි පණිවුඩ සම්බන්දතාවය මගින් මහජනතාවගේ ගිණුම් භාවිතා කරමින් සිදුවන ඕනෑම වංචනික ක්‍රියාවක් පිළිබඳව ක්ෂණිකව මහජනතාව දැනුවත් වනු ඇත.